# බොනවා නම් චීන විස්කි!

## අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

සතියකට පමණ ඉහත දිනයක අප කිහිප දෙනෙකුට තම අත්දැකීමක් විස්තර කරමින් ඊ-ලිපියක් එවූ මගේ මිතුරෙකු කියා තිබුණේ, කාගෙන් දෝ තෑග්ගකට ලැබුණු යම් වර්ගයක චීන විස්කි බෝතලයක් තමන් සමග හොංකොං හි සිට චීනය හරහා ඇමරිකාවට ගිය හැටිත්, එහිත්, වෙනත් මැද පෙරදිග රටකත් කාලයක් තිස්සේ නිරුපද්‍රිතව තිබී මෙයින් සති දෙකකට පමණ පෙර තමන් ගේ ඊළඟ සේවා ස්ථානය පිහිටි රටට යාමට නියමිත වූ දිනයට පෙර දිනයේ දී එහි මූඩිය විවර වූ හැටිත්, එදා තම මිතුරෙකුත් තමාත්, ඒ පානයේ ඇති අති සුමිහිරිකම අත්විඳ වශී වූ හැටිත් ය. ඔහු ගේ ඇගයීම අනුව, ඒ ඔහු පානය කර තිබූ විවිධාකාරයේ බීම අතරින් අගනා ම බීම වර්ගයයි. චීන විස්කි හමුවේ කළු ලේබල නිකම් නවදැලිහේනේ වැදිරියන් වැනිය!

ඒ ඊ-ලිපිය දුටු මගේ මතකයට නැගුණේ මීට වසර ගණනාවකට පෙර දිනයක මා මුහුණ දුන් එක්තරා අපූරු සිදුවීමකි.

මේ සිදුවීම වූ කාලයේ මම "තිත්ත මිදි" පිළිබඳ ආචාර්ය උපාධි නිබන්ධනයක් ලියමින් වෙනත් විශ්ව විද්‍යාලයක සහකාර කථිකාචාර්යවරයෙකු ලෙස

**මේ සෙමෙස්ටරයේ අවසන් සති කිහිපය තුළ එක් දිනක මගේ කාර්යාල කාමරයේ දොරට තට්ටු කරනවා ඇසුණි. දොර විවර කළ විට ඒ ඉදිරියේ සිටියේ තරමක් හුරු පුරුදු මුහුණකින් යුතු කාන්තාවකි. ඒ විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක් බව මොහොතකින් පසක් විය. මේ ආකාරයට සිසුන් දේශකයින් හමුවීමට එන්නේ බොහෝ විට තමන් ගේ ලකුණු පිළිබඳව සාකච්ඡා කිරීමටයි.**

සේවය කරමින් සිටියෙමි. මට පැවරී තිබුණු එක් රාජකාරියක් වූයේ මුල් උපාධි අපේක්ෂකයින් ගේ පාඨමාලාවේ කොටසක් වූ වෙබ් අඩවි සංවර්ධනය පිළිබඳව සැකසුණු විෂයය ඒකකය සම්බන්ධීකරණය කිරීමයි. මේ විෂයය ඒකකය සඳහා හාරසියයක් පමණ සිසුන් විශ්ව විද්‍යාලයේ මණ්ඩප තුනක ලියා පදිංචි වී සිටි අතර, ඔවුන් සඳහා දේශන පැවැත්වීමට වෙනත් දේශකයින් දෙදෙනෙකු ගේ ද, විද්‍යාගාර සහායකයින් සිව් දෙනෙකු ගේ පමණ සේවය ද මට ලැබුණි.
මගේ කාර්යාලය තිබූ මණ්ඩපයේ පැවැත්වෙන දේශනය සහ එක් විද්‍යාගාර පන්තියක් භාරව කටයුතු කිරීමට අමතරව, සම්බන්ධීකාරක ලෙස මගේ වගකීමක් වූයේ විෂයය ඒකකයට අදාළ පාඨමාලාව සංවර්ධනය කිරීම සහ සියලුම සිසුන් ගේ ප්‍රගතිය පිළිබඳ සොයා බැලීමයි.
මේ විෂයය ඒකකයට අවසන් පරීක්ෂණයක් නොතිබුණු අතර විෂයය සමත්වීම සඳහා සිසුන්ට විද්‍යාගාර අභ්‍යාස, කෙටි විභාග සහ පැවරුම් හරහා ලකුණු ලබා ගත යුතු විය.

අවසන් පරීක්ෂණයක් නොමැති වීම, විද්‍යාගාරය පන්තිවලට පැමිණීම අනිවාර්ය නොවීම, පළමු වසර විෂයය ඒකකයක් වීම යනාදී විවිධ හේතු නිසා, මා සේවය කළ පරිගණක සහ තොරතුරු තාක්ෂණ පීඨයයේ සිසුන් විශාල පිරිසට අමතරව, අල්ලපු වැටේ පිහිටි ඉංජිනේරු විද්‍යා පීඨයේ සිසුන් ද මේ වෙබ් අඩවි සංවර්ධනය විෂයය ඒකකයට ලියා පදිංචි වුවද, ඒ අය අතරින් අතර මගදී හැලෙන්නන් (අත් හැර දමන්නන්) ගේ මෙන්ම, විෂයය ඒකකය ඇණ ගන්නන් (අසමත් වෙන්නන්) ගේ ද සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස ඉතා ඉහළ විය. මා කලින් කියූ පරිදි මේ විෂයය ඒකකයේ අගැයීම් සෙමෙස්ටරය පුරා සිදු වූ නිසා, අවසාන මොහොතේ දී පමණක් තමන් ගේ ලකුණු ප්‍රමාණය ඉහළ මට්ටමකට පත් කර ගැනීම ඉතා අපහසු කරුණක් විය.

මේ විෂයය ඒකකයේ සම්බන්ධීකරණය මට පැවරුණු පසු, පළමු සෙමෙස්ටරයේ දී මේ කරුණු හොඳින් වටහා ගත් මා, දෙවන සෙමෙස්ටරයේ දී ලියා පදිංචි වුණු කණ්ඩායම සඳහා සුවිශේෂී වැඩපිළිවෙළක් හොඳින් සැලසුම් කර දියත් කළෙමි.

එහි ප්‍රධාන අංගයක් වූයේ, සෙමෙස්ටරයේ මුල් අඩ තුළදී විද්‍යාගාර අභ්‍යාසවලට, කෙටි පරීක්ෂණයන්ට සහ පැවරුමට ලකුණු අඩුවෙන් ලබන සිසුන් සොයා ඔවුන්ට ඒ ගැන ඊ-මේල් මගින් දැනුම් දී, උපකාර සහ උපදේශ සැපයීමයි.
මේ කරුණු නිසා, සිසුන්ට මා හමුවීම සඳහා මා වෙන් කර තිබූ පැය කිහිපය තුළ දී ද, ඉන් පිටස්තර දින සහ කාලවේලාවල දී ද, මා හමුවීමට මගේ කාමරයට එන පිරිස සාපේක්ෂකව ඉතා ඉහළ විය.

මේ සෙමෙස්ටරයේ අවසන් සති කිහිපය තුළ එක් දිනක මගේ කාර්යාල කාමරයේ දොරට තට්ටු කරනවා ඇසුණි. දොර විවර කළ විට ඒ ඉදිරියේ සිටියේ තරමක් හුරු පුරුදු මුහුණකින් යුතු කාන්තාවකි. ඒ විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක් බව මොහොතකින් පසක් විය. මේ ආකාරයට සිසුන් දේශකයින් හමුවීමට එන්නේ බොහෝ විට තමන් ගේ ලකුණු පිළිබඳව සාකච්ඡා කිරීමටයි.
මගේ ඇරයුමෙන් කාමරයට ඇතුළත පැමිණි ඇය අසුන් ගෙන ඇගේ නම සහ ශිෂ්‍ය අංකය පැවසුවා ය. මම පරිගණකයෙන් ඇගේ විස්තර සහිත වාර්තාව සොයා ගතිමි. ප්‍රශ්නය වී තිබුණේ මේ සිසුවියට හදිසියේම විදෙස් ගත වීම නිසා සති දෙකක දේශන සහ විද්‍යාගාර පැවරුම් අතපසු වීමයි.

මා වහාම විශ්ව විද්‍යාලයේ පැවති නීති රීතිවලට අනුකූලව ඒ පිළිබඳව නිසි උපදෙස් ලබා දුනිමි. ඒ විස්තරවලින් සෑහීමට පත් වූ ඇය පිටවී යන්නට සැරසී නැගී සිටියා ය.



මා ඇයට සමුදෙනවාත් සමගම ඇය තමා ළඟ එතෙක් තබාගෙන සිටි බෑගයකින් ගත් සිලින්ඩිකාකාර පාර්සලයක් මා වෙත දිගු කළාය.
"මේ මොකක්ද?" මම විමසුවෙමි.

"මේ චීන විස්කි වර්ගයක්. ගෙදර ගොස් එන විට ගෙනාවේ. ඔබට තෑග්ගක්!" ඇය කීවාය.
"බොහොම ස්තුතියි! නමුත් එපා!"මම කාරුණිකව එය ප්‍රතික්ෂේප කරමින් කීවෙමි.

"කරුණාකරලා බාරගන්න!" එවිට ඒ චීන ජාතික සිසුවිය කීවේ ආයාචනා කළේ "මගේ සැමියා තමයි කීවේ ඔබට තෑගි කරන්නට කියා" යනුවෙන් නිදහසට කරුණක් ද එකතු කරමිනි.

"නැවතත් බොහොම ස්තුතියි. නමුත්, විශ්ව විද්‍යාලයේ නීති රීති අනුව මට ඔබෙන් තෑගි ගන්න බෑ!" මම ස්ථිරසාර හඬකින් කීවෙමි.
ඇය එය වටහාගත් සේ මද සිනාවක් පා කාමරයෙන් පිටත්ව ගියා ය.

නීති රීති සාදා තිබේ ද, නැති ද යන්න කෙසේ වුවත්, පාසලක හෝ විශ්ව විද්‍යාලයක වේවා, සේවා ස්ථානයක වේවා, මේ ආකාරයේ තෑගි දීමක් හෝ පිළිගැනීමක් නුසුදුසු බව අමුතුවෙන් කිව යුතු නොවේ.

එදා තියා අද දක්වා ම සුමිහිරි චීන විස්කි රහ බලන්නට කිසිදු අවස්ථාවක් නො ලැබීම ගැන මට අබමල් රේණුවක තරම් හෝ දුකක් නැත!
සඳ නොවෙනස් තිත්ත මිදි සේ ම නව දැළි හේනේ රැඟුම් ද තවමත් මට සෑහේ!

වසර කිහිපයකට පෙර මා ලංකාවට ගිය එක් අවස්ථාවක, මිතුරන් කිහිප දෙනෙකු සමග අල්ලාප සල්ලාපයේ යෙදෙමින් රාත්‍රී ආහාරය ගැනීමේ අවස්ථාවක් උදාවිය.

අප එදා ගියේ කෝට්ටේ ප්‍රදේශයේ දියවන්නාව අසල ම වාගේ පිහිටි ආපන ශාලාවකටයි. මේ ආපන ශාලාවේ අප අසුන් ගත් මේසයට ආසන්න මේස කිහිපයක ම සිටියේ චීන ජාතියකින් ය. ඔවුන් ගේ ප්‍රියතම පානය ලෙස මට පෙනී ගියේ කළු පැහැති ලේබලයෙන් යුතු අපි කවුරුත් වාගේ හොඳින් දන්නා මිශ්‍ර විස්කි වර්ගයයි.

විස්කි සඳහා ලොව සුපතල ප්‍රදේශය ස්කොට්ලන්තයයි. හෝටලයේ සිටි චීනුන් කණ්ඩායම ස්කොට්ලන්තයේ නිෂ්පාදිත මිශ්‍ර විස්කි පානය කළ ද, චීනයේ ද විස්කි නිපදවෙන බව මම දැන සිටියෙමි. එහෙත් මා මේ මෑතක් දක්වා ම නොදැන සිටි කරුණක් වෙන්නේ එකී චීන විස්කි වර්ග අතර ප්‍රමිතියෙන් මෙන්ම මිලෙන් ද ඉතා ඉහළ වර්ග කීපයක් ම ඇති බවය.

**FOR ALL YOUR TRANSLATIONS**
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

( ENGLISH TAMIL SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
**DR. PREMA KUDALIGAMA**
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com